# සෝමාවතිය ස්තූප ආයකයෙන් පිළිඹිබු වන අතීත ශ්‍රී ලංකාවේ ස්තූප ආයකවල ආරම්භක උපයෝගීතාව

ඩිලාන් රණවීර[1]

ශ්‍රී ලංකාවේ ඓතිහාසිකත්වය වශයෙන් ක්‍රි.පූ. තෙවන සියවසේ දී ඇරඹී යැයි සැලකෙන ස්තූපල ආරම්භක සමයෙහි සුවිශේෂී හා පොදු ලක්ෂණයක් වූයේ බුදුරජාණන් වහන්සේගේ සර්වඥ ධාතු නිධන්කොට ගොඩනැංවීමයි. මෙසේ නිර්මිත ස්තූප උදෙසා ප්‍රාරම්භක සමයෙහි ආයක ඉදිකොට තිබූ බවට සාධක නොලැබෙන අතර මෙම අංගය ක්‍රි.ව. දෙවන ශතවර්ෂයේ මැදභාගය වන විට එකතු වී පැවති බව අභයගිරි ස්තූපයෙන් පැහැදිළි වන බව පරණවිතාන මතයයි. දැනට පුරාවිද්‍යාත්මකව ක්‍රි.පූ. පළමුවන සියවසෙහි හා සාහිත්‍යගත පදනම තුළින් ක්‍රි.පූ. දෙවන සියවසෙහිලා ඉදිකරණ ලද බවට මත පළවී ඇති පොළොන්නරුව සෝමාවතිය ස්තූපයෙහි දක්ෂිණ අර්ධයෙහි විද්‍යමාන වනල ප්‍රතිනිර්මාණය නොකරන ලද ආයකය මෙහි දී පරීක්ෂාවට බඳුන් විය. 1964 චෛත්‍ය හා මළුවෙහි කරණ ලද කැණීම් තුළින් මතුකරගෙන ඇති මෙම අංගය තරමක් දුරට කාමර මෙන් කුඩා ගෘහයක හැඩය ගනී. මෙම **ගෘහායකය** ඓතිහාසිකත්වය අතින් සෝමාවතිය ස්තූපය හා සමකාලීන හෝ පූර්වකාලීන ලංකාවේ සර්වඥ ධාතූන් වහන්සේලා තැන්පත් කොට ඉදිකර ඇති ස්තූපයන්හි ආයක නිරීක්ෂණයෙන් හා කැණීම් වාර්තා කේන්ද්‍ර කර ගනිමින් පර්යේෂණය මෙහෙයවිනි. මෙහිදී අනුරාධපුරයේ රුවන්වැලිසෑය,අභයගිරිය,ජේතවනාරාමය, මිරිසවැටිය හා මිහින්තලයේ කන්ථක චෛතිය ආදී ස්තූපයන්හි ආයක පිළිබඳව ද පසුකාලීන ඉදිකිරීම් වුවද ප්‍රාදේශීය වශයෙන් ඒකාබද්ධතාවක් ඇති පොළොන්නරුවේ කිරිවෙහෙර හා රන්කොත් වෙහෙර ආශ්‍රිත ආයක පිළිබඳව ද අවධානය යොමු කරන ලදී.

මුල්කාලීන ලංකා ස්තූපයන්හි ආයක ඉදිකිරීම හා සම්බන්ධ බොහෝ පදනම් බිහිවී ඇත්තේ ආයකයන්හි ඉදිකිරීම් රටාව හා එහි ලේඛනගත වාච්‍යාර්ථ කේන්ද්‍රකර ගනිමිනි. ඒවා උපයෝගීතාව ප්‍රතිනිර්මාණයෙහිලා ද පදනම විය. එනමුදු යථෝක්ත ස්තූපය හා එහි ආභ්‍යන්තරික අංග කෙරෙහි ආයකයන්හි යම්කිසි සම්බන්ධයක් ඇද්දැයි පරීක්ෂා කොට ඇති බවක් නොපෙනෙයිග මෙය පර්යේෂණ ගැටලුවෙහිලා සලකා සෝමාවතිය ස්තූප ආයකය

---

[1] පුරාවිද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය
Email: kkdcr@yahoo.com

ඇසුරින් ඒ පිළිබඳව අවධානය යොමු කිරීම මෙහිලා බලාපොරොත්තු වෙයි.

පසුකාලීනව ලංකාවේ ස්තූපයන් නිර්මාණය කිරීමෙහිදී එහි ස්තූපාංගයක් ලෙස ඉදිකරන ලද ආයකය ක්‍රි.ව. දෙවන සියවස කාලයෙහිදී එනම් ස්තූපයන් උදෙසා නව්‍යාංගයක් ලෙස එකතු වූ කාලයෙහි පැවති උපයෝගීත්වය ගෘහාත්මක නිර්මාණ ලක්‍ෂණය තුළින් පැහැදිළි කරගත හැකිය. සෝමාවතිය ස්තූපයෙහි සාහිත්‍යගත තොරතුරු අනුව බුදුන්ගේ දක්‍ෂිණ ශ්‍රී දංෂ්ට්‍රා ධාතූන් නිධන් කොට ඉදිකර ඇති අතර ඒ අනුව මෙරට ප්‍රථමයෙන් නිධන් වූ දංෂ්ට්‍රා ධාතූන් වහන්සේ වන්නේ මෙයයි. කිත්සිරිමෙවන් රජු දවස (ක්‍රි.ව.) මෙරටට වැඩම වූ ජීවමාන වාම ශ්‍රී දංෂ්ට්‍රා ධාතූන් වහන්සේට පෙර ධාතූන් වන්දනය පැවතියේ ස්තූප කේන්ද්‍ර කරගෙනය. මෙය ඉහත කී අනුරාධපුරයේ අවශේෂ ස්තූපයන් සඳහාද පොදු වන අතර ස්තූප ඉදිකළ මුල් කාලයෙහි ධාතූන් වන්දනය එනම් ආවිසමය පුදපූජා කෙරෙහි එතරම් ජනප්‍රියත්වයක් නොතිබුණ අතර ශතවර්ෂ දෙකක් පමණ අවෑමෙන් නානා ආගමික සංකල්ප ඔස්සේ ධාතු වන්දන ක්‍රම බිහිවිය. සදෘශ්‍ය නොවන ධාතූන් වහන්සේලා වන්දනය හා තේවා පූජා විධි උදෙසා **ගෘහායකයක්** වශයෙන් ඉදි වූ මෙම අංගය සෝමාවතිය ස්තූප ආයකය තුළින් ප්‍රතිබිම්බනය කරයි. සමකාලීන වෙනත් ස්තූප ආයකයන් තුළින් ද හඳුනාගත හැකි ගෘහායකයෙහි ශේෂ පසු කාලීනව අලංකරණාත්මක අංගයක් බවට පත් වූයේ සදෘශ්‍යමානව ධාතූන් වහන්සේ වන්දනයට පාත්‍රවීම විය හැකිය.

ප්‍රමුඛ පද: සෝමාවතිය ස්තූප ආයකය, ධාතු වන්දනය, ගෘහායකය
**Title:** The Utility of Ayaka and Somavathi Stupa
**Keywords:** Ayaka of Somavathi Stupa, Relic worship, Ayaka